සැ. යු. - 2014.07.04 දින පළ වූ අංක 1,870 දරන ගැසට් පත්‍රයේ I: III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,871 - 2014 ජූලි මස 11 වැනි සිකුරාදා - 2014.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1154 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1155 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1156 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1163 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1168 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1171 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 01 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 ජූලි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.*

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ටොන් 5 බර GVW 4 වීල් ඩ්‍රයිව් පුළුල් කෘෘ කැබ් 4ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත දල වාහන බර ටොන් 5 (GVW) 4 වීල් ඩ්‍රයිව් පුළුල් කෘෘ කැබ් 04ක් සැපයීම සඳහා කොළඹ, තැ. පෙ. 355, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් සැපයුම් කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා මෙයින් ඇරයුම් කෙරේ.

02. කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී 2014 ජූලි 18 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන රු. 5,000 ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා, ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2014 ජූලි 17 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මත සටහන් කරන ලද ලංසු පමණක් භාරදිය යුතුයි.

04. කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී, ලංසු භාරගැනීම අවසන් කළ වහාම එම ලංසු විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වන ලෙස ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙන විත් පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුයි.

සභාපති,<br>
දෙපාර්තමේන්තු (ප්‍රධාන) ප්‍රසම්පාදන කමිටුව,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය සේවා මූලස්ථානය,<br>
ඕල්කට් මාවත,<br>
කොළඹ 10.

06. වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර පහත සඳහන් ලිපිනය ආමන්ත්‍රණය කරන්න.

දුම්රිය ගබඩා අධිකාරී,<br>
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,<br>
කොළඹ 10<br>
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328<br>
ෆැක්ස් අංක : 94 (11) 2432044<br>
ඊමේල් : srs.slr @gmail.com<br>
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,<br>
දෙපාර්තමේන්තු (ප්‍රධාන),<br>
ප්‍රසම්පාදන කමිටුව.

යොමු අංක : SRS/F.6941

07-314

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීම

**රාත්තල් 88 රේල් සෙක්ෂන් කොන්ක්‍රීට් සිල්පර සඳහා රබර් පෑඩ් 200,000ක් ප්‍රසම්පාදනය කිරීම**

කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රා. 88 රේල් සෙක්ෂන් කොන්ක්‍රීට් සිල්පර සඳහා රබර් පෑඩ් 200,000ක් මිළ දී ගැනීම සඳහා නිෂ්පාදකයින් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. 2014.07.17 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. 2014.07.16 වැනි දින ප. ව. 3.00 දක්වා රු. 2,500.00 ක ආපසු නොගෙවන ලිපිලේඛණ ගාස්තුවක් ගෙවීම මත කොළඹ 10 ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. 2014.07.17 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වන අතර, ලංසු භාරගැනීම අවසන් කිරීමේ වේලාව ඉක්මයාමත් සමග ම විගසින් ම කොළඹ 10 ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙස ආරාධනා කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ භාරදිය යුත්තේ,

සභාපති,<br>
(ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, වැඩිමනත් විස්තර සඳහා කරුණාකර සම්බන්ධ විය යුත්තේ,

දුම්රිය ගබඩා අධිකාරී,<br>
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.<br>
දුරකථන අංකය : 2438078 හෝ 2436818<br>
ෆැක්ස් අංකය : 2432044

සභාපති,<br>
(ප්‍රධාන), දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 7159

07-338

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ස්නැප් හෙඩ් මයිල්ඩ් ස්ටීල් රිවට් 72000ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය**

කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ස්නැප් හෙඩ් මයිල්ඩ් ස්ටීල් රිවට්, 72,000 ක් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසු තබන්නන් විසින් තමන්ගේ ලංසු සෘජුව හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලයක් මගින් ලිඛිතව බලය පවරනු ලැබූ නියෝජිතයින් මගින් ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා රු. 3,000 ක් හෝ පහසුවෙන් හුවමාරු කරගත හැකි ඒ හා සමාන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීම මත, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙතින්, (ශ්‍රී ලංකා වේලාවෙන්) 2014.08.14 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණකි.

03. 2014. 08.15 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු අවසන් කරනු ලැබේ.

04. ලංසු අවසන් කිරීමේ වේලාව ඉක්ම යාමත් සමගම විගසින් ම ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. ලංසුකරුවනට හෝ ඔවුන්ගේ බලය පවරන ලද නියොජිතයින්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙස ආරාධනා කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ භාරදිය යුත්තේ,

සභාපති,
(මහාපරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.

06. කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛණ නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, වැඩිමනත් විස්තර සඳහා කරුණාකර සම්බන්ධ විය යුත්තේ,

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.

දුරකථන අංකය 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
(මහාපරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 6925

07-337

---

# බඩු බාහිරාදිය විකිණීම්

**පොලිස් දෙපාර්තමේන්තුව - පොලිස් ක්ෂෙත්‍ර බලකා මූලස්ථානය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් ක්ෂත්‍ර බලකා මූලස්ථානයට අයත් පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ බහාලුම් පෙට්ටි (කන්ටේනර් පෙට්ටි) 02ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2014 ජූලි 22 වැනි දින පැය 0900 කොළඹ 04 පොලිස් ක්ෂත්‍ර බලකා මූලස්ථානය පරිශ්‍රයේ දී පැවැත්වේ.

2014 ජූලි මස 21 වැනි දින පැය 1300 සිට පැය 1600 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුලුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතුයි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලැබූ භාණ්ඩ 2014 ජූලි මස 22 වැනි දින පැය 1600 පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

අණදෙන නිලධාරී,
පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය.

07-319

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා සහ විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම - 2015 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලට යටත්ව, 2015 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සහ (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2014.08.07 සහ 2014.08.08 දිනයන් හි දී පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන වේලාවන් දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුළු මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, රා තැබෑරුම් 2014.10.06 වැනි දින පෙ. ව. 10.30ට ද, විදේශ මත්පැන් හල 2014.10.07 වැනි දින පෙ. ව. 10.30ට ද මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2014 ජුනි මස 17 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2014.08.07 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. | 2014.08.07 පෙ.ව. 10.30 | 1,000 |
| අංක 3 - කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2014.08.07 පෙ. ව. 10.30 | 1,000 |
| *විදේශ මත්පැන් තැබෑරුම :* අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය ඉහළ කඩවීදිය | 2014.08.08 පෙ. ව. 10.30 | 3,000 |

07-233

---

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය සහ ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2015 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන මා විසින් 2014.08.12 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය :

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර :-

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්, හා

(ආ) වත්කම් සහතිකයක්
සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතු යි. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් උඩපලාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර 'වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි' ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30 ට පෙර උඩපලාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදල් වලින් හෝ බැංකුවකින් 'ගෙවීම් සඳහා' සලකුණු කර චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2014.10.10 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
උඩපලාත -ගම්පොළ.

2014 ජූනි මස 18 වැනි දින,
උඩපලාත-ගම්පොල.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***2015 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව***

| | *අනු. අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | වහුගපිටිය රා තැබෑරුම | උඩපළාත | වහුගපිටිය ගම තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2014.08.12 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 1,500 |
| 02. | පුස්සැල්ලාව රා තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2014.08.12 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 3,000 |

07-200/1

---

**2015 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ රා රේන්ද විකිණීම**

2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට කොට්ඨාසයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5000 ක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කළ යුතුය. තව ද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් ගැසට් නිවේදනයේ පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කළ නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පස මුදුණේ "හම්බන්තොට කොට්ඨාසයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2015" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2014.08.04 වැනි දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසන වේලාවේ දී සියළුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුයි.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2014.08.04 වැනි දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවතත් ටෙන්ඩර් භාර ගන්නා දිනය 2014.10.01 වැනි දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

වයි. කේ. ශිරෝමි ජීවමාලා,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2014 ජුනි මස 18 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**2015 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2014.08.04 වැනි දින පෙ.ව. 10.00 | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා |

07-201

---

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

2015 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි, සහ
(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2015 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2014 අගෝස්තු මස 01 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදල ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහි ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| අනු. අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය හා කොටස | තැබෑරුම විවෘත කරන වේලාව |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයා ගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගත යුතු අනුමැතිය බලය ලැබීමේ වරප්‍රසාද ආරම්භවීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්* .- 2014.08.01 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2014.09.29 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

එස්. එම්. සමන් බන්දුලසේන,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුරය.

2014 ජුනි මස 25 වැනි දින.

07-355

---

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2015 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2015 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන මවිසින් 2014.08.14 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය ;
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය ;
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපාහැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය ;
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර හා නියමිත වේලාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබාගන්නා ලද -

*(අ)* ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්

ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් ඉහළ කෙළවරේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන්කර මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "**ගෙවීම සඳහා**" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "**ආරක්ෂිත චෙක්පත්** " නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. රා තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග (පීප්ප) රා නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී ආරක්ෂක හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන රා තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2014.10.14 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

ඩී. එම්. එන්. ජී. ජී. ටී. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළය.

2014 ජූනි මස 25 වැනි දින,
මහනුවර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2015 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

| | *අනුක්‍රමික අංක, කොට්ඨාසය, තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය, තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| 01. | අංක 1 වටපුළුව | මහනුවර කොට්ඨාසයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය | කටුගස්තොට පාරේ කටුගස්තොට පාර සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියෙහි කටුගස්තොට පාර සහ වට්ටාරන්තැන්න මංසන්ධිය අතර පාර මහනුවර නාගරිකයේ අංක 20 මහයියාව සහ අංක 7 මාපනාවතුර ඡන්ද කොට්ඨාසය තුළ පිහිටි ප්‍රදේශය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2014.08.14 පෙ. ව. 10.30 |

*රා තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2015 :* - අංක 1 වටපුළුව - රා තැබෑරුම් රේන්දය රුපියල් 5,000.

07-374/1

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

වැල්ලවත්ත, පළමුවැනි චැපල් පටුමගේ 16 1/2 හි ලීලාවති කන්දප්පු වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. තවනේසන් විසින් ලියා සහතික කරන ලද 2013 අගෝස්තු මස 9 වැනි දින සහ අංක 8682 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් යාපනය, තිරුනෙල්වේලි උතුර අරසස් පාරේ කනගසබෙයි ඉන්ද්‍රලිංගම් වෙත පවරන ලද ඇටර්නි බලය 2013 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට, අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනයා වෙත මෙයින් දැනුම් දෙන අතර, මෙතැන් සිට මා වෙනුවෙන් ඔහු විසින් එලඹෙන කිසිදු ගනුදෙනුවකට මා වගකියනු නොලැබේ.

ලීලාවති කන්දප්පු.

07-180

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ටී එස් මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99148
ලියාපදිංචි ලිපිනය : එෆ් 66, මධ්‍යම බස් නැවතුම්පල, කුරුණෑගල
සංස්ථාගත කළ දිනය : 2014 ජුනි 17 වැනි දින.

සමාගමේ අධ්‍යක්ෂ.

07-190

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සුසන්ත එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97267
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 02, පළමු මහල, සිටි වීව් සාප්පු සංකීර්ණය, වැල්බට් ටවුම, ගාල්ල
සංස්ථාපනය කළ දිනය : 2014.02.26.

මධුප හෙට්ටිගම,
සමාගම් ලේකම්.

07-192

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:-

සමාගමේ නම : රොචික් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 98608
ලියාපදිංචි කාර්යාලය : අංක 12, ගෝතමී මාවත, ගල්කිස්ස
ලියාපදිංචි කළ දිනය : 2014.05.19

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් පී. වී. 259 ,
සමාගම් ලේකම්වරු.

07-193

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මන්නාරම, තාරාපුරම් හා දැනට වත්තල මාබොල සිද්ධාර්ථ මාවත අංක 23 හි පදිංචි 1, සෙයිනුල් ආබ්දින් උසෙයීර් 2. සෙයිනුල් ආබ්දීන් අබ්දුල් කතීර් හා 3. අසාර්ගේ භාර්‍යාව උමෙයීරා වන අපි විසින් මන්නාරම, එරුකලම්පිඩි, පුදුකුඩිඉරුප්පු දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් රිසාත් සෙක් අමානී යන අය වෙනුවෙන් මන්නාරම ප්‍රසිද්ධ නොතාරිස් වන එම්. බී. ෆාරුක් මහතා විසින් 2010.11.19 වැනි දින හා අංක 8812 යටතේ ලියා සහතික කරන ලද හා යාපන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 975 වන කාණ්ඩය 85 වන පත් ඉරුවේ දිනපොත් අංක 38 යටතේ 2011.03.31 වැනි දින දී ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය, බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසුව ඔහු විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් අපි වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමු.

1. සෙයිනුල් ආබ්දින් උසෙයීර්
2. සෙයිනුල් ආබ්දීන් අබ්දුල් කතීර්
3. අසාර්ගේ භාර්‍යාව උමෙයීරා

07-203

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

### සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : වර්ටුසෝ පවර්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4079
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2014.05.30 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ/සමාගම් ලේකම්.

07-212

---

## සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ජේදය යටතේ මෙම දැනුම් දීම කරනු ලැබේ.

සමාගමේ නම : එස්. ඇන්ඩ් එම්. ඩෙවලප්මන්ට් ඇසෝසියේට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 98582
දිනය : 2014.05.16
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 27, පැපිලියාන පාර, නුගේගොඩ

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02
2014 මැයි මස 28 වැනි දින.

07-216

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

No. 17, Sundown Drive, Bellport, New York, 11713 යන ලිපිනයේ පදිංචි සෝලංග ආරච්චිගේ දොන් රුවන් පද්මප්‍රිය පෙරේරා නොහොත් රුවන් පෙරේරා (විදේශ ගමන් බලපත්‍ර අංක 214679393) වන මම කුරුණෑගල, වෙලන්ගොල්ල පාර, අංක 100 සී හි පදිංචි සෝලංග ආරච්චිගේ දොන් චමින්ද ගීතික පෙරේරා යන අයට නිව්යෝර්ක් හි ප්‍රසිද්ධ නොතාරිස් ජෙෆ්රි එම්. රොබට් මහතා විසින් ලියා සහතික කරන ලද වයඹ උතුරු මැද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2012.04.05 වැනි දින පොත් අංක 52 ඇටෝර්නි බලපත්‍ර පොතේ 3588 කාණ්ඩයේ 1092 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති 2012.03.09 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් දී ඇති සියලුම බලතල අද දින 2014.06.23 වැනි දින සිට අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයටත් මහජනයාටත් මෙයින් දැනුම් දෙමි. මින් පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත සඳහන් සෝලංග ආරච්චිගේ දොන් චමින්ද ගීතික පෙරේරා යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මම වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

සෝලංග ආරච්චිගේ දොන් රුවන් පද්මප්‍රිය පෙරේරා.

07-223

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීමේ දැනුම්දීම

අංගොඩ, ගොතටුව, අංක 210 පදිංචි චන්ද්‍රසේන කස්තුරිආරච්චි වන මම, 2013 අගෝස්තු මස 26 වැනි දින 1234 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කළ බව සැම සියලු දෙනාටම මෙමගින් දන්වා සිටිමි. මෙම ඇටර්නි බලපත්‍රය සහතික කරන ලද්දේ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා මහතා විසිනි. 2013 දෙසැම්බර් මස 31 දා සිට බලපවත්වන සේ ඒසියන් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගමට ඇටර්නි බලපත්‍රය මගින් බලතල පවරා තිබිණි.

07-275

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෞද්ධ මධ්‍යස්ථානය, නුගේතොට, ඇත්කඳුර, ලිපිනයේ පදිංචි ජා. හැ. ප. අංක 800904242 වී හිමි පූජ්‍ය වැලිවිටියේ සුජීව හිමි වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඩී. එස්. පෙරේරා මහතා විසින් 2013.10.10 වැනි දින ලියා සහතික කරන ලද අංක 13 දරන ඇටෝර්නි බලපත්‍රයේ අධිපතියකු බව සඳහන් කරන ලද අතර එමගින් බලය පැවරූ ඇටෝර්නි බලකරු වන පිළියන්දල, මඩපාත පාරේ, අංක 70/1 හි පදිංචි ජා. හැ. ප. අංක 682340070 වී හිමි ලංකා හේවගේ සුමල් ශාන්තසිරි යන අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරමි.

07-276

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම්දීමයි.

සමාගමේ නම : ටෙන් ඉන්ජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංක : පී වී 99144
සංස්ථාපිත දිනය : 2014.06.17
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 205, දඹුල්ල පාර, කුරුණෑගල.

සමාගම් ලේකම්.

07-277

---

## කැස රෝයලි (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි.

2014 ජුනි මස 20 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 99238 යටතේ කැස රෝයලි (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය මීගමුව, සෙල්ලකන්ද පාර හි අංක 365/5 හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති,

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

07-279

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

01. සමාගමේ නම : රියෝ හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99149
03. සංස්ථාගත කළ දිනය : 2014 ජුනි 17
04. ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 98, මිරිහාන, පිටකෝට්ටේ.

සමාගම් ලේකම්.

07-281

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි.

වර්ෂ 2014.05.09 වැනි දින ජී ටී වී නෙට්වර්ක්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී. නමින් සමාගමක් කොළඹ 05, සුලෙයිමන් ටෙරස් අංක 5/21, හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 98497 බවත් ශ්‍රී ලංකා වාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-282/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි.

වර්ෂ 2014.05.20 වැනි දින මේල්ත් (පී. වී. ටී.) එල්. ටී. ඩී. නමින් සමාගමක් කොළඹ 05, සුලෙයිමන් ටෙරස් අංක 5/21, හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 98636 බවත් ශ්‍රී ලංකා වාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-282/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබ ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : එල් ඇවනියු (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 99177
ලියාපදිංචි කළ ලිපිනය : අංක 30, සාප්පු අංක 19, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
සංස්ථාගත කළ දිනය : 2014 ජුනි 18 වැනි දින.

සමාගම් ලේකම්.

07-238

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 ජුනි 11 වැනි දින සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමෙහි නාමය : ඉන්ටර්නැෂනල් ෂිපිං බියුරෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99079
ලියාපදිංචි ලිපිනය : අංක 9, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 04

ජේසී ඇන්ඩ් කම්පැනි,
කම්පැනි සෙක්‍රටරීස්,
අංක 9/5, තම්බයියා ඇවනියු, කොළඹ 7.

07-313

## දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : රොහාන් ස්ටුඩියෝ ඇන්ඩ් ඩිජිටල් කලර් ලැබ් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : ධර්මාලෝක මාවත, ඇවරිවත්ත, කටුනායක
සමාගමේ ලියාපදිංචි අංකය : P V 90903
සංස්ථාගත කළ දිනය : 2013.02.07

ලේකම්.

07-315

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

සූරියවැව, ඇඹිලිපිටිය පාර, 9 කනුව, යන ලිපිනයේ පදිංචි ගුණරත්න සභාපති ගමගේ ක්‍රිෂාන්ත ප්‍රදීප් කුමාර (ජා. හැ. අංක 790820126 V) යන අය විසින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එන් ජී දිලාන් ලංකා රවීන්ද්‍ර වර්ෂ 2013 නොවැම්බර් මස 30 වැනි දින ලියා සහතික කරන ලද අංක 1216 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් එකී ඇටර්නි බලකරු ලෙස සෙවනගල මිහිඳුගම අංක 705 දරන ලිපිනයේ පදිංචි සරත් පත්මේන්ද්‍ර ගමගේ (ජා. හැ. අංක 801123775 V) යන අය වෙත හිමිකර ඇති ඇටර්නි බලය මෙයින් අවලංගු කරන ලද බවත්, එකී ඇටර්නි බලය ප්‍රකාර මා වෙනුවෙන් හෝ මාගේ නාමයෙන් එකී සරත් පත්මේන්ද්‍ර ගමගේ විසින් එළඹෙන කවර හෝ ගිවිසුමක් කරනු ලබන ක්‍රියාවක් හෝ ගනුදෙනුවක් සම්බන්ධව මාගේ වගකීමක් නොවන බවට පොදු මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ගුණරත්න සභාපති ගමගේ ක්‍රිෂාන්ත ප්‍රදීප් කුමාර.

07-330

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුගාමීව පහත සඳහන් සමාගම 2014 අප්‍රේල් මස 03 වැනි දින සංස්ථාගත කොට ඇත.

සමාගමේ නාමය : ත්‍රී ලොජිකල් ප්‍රොඩක්ට්ස් ඇන්ඩ් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97990
සමාගමේ ලිපිනය : 14 සී, ෆෙයාමවුන්ට්, රෙසිඩන්සීස්, බුත්ගමුව පාර, රාජගිරිය.

අධ්‍යක්ෂක.

07-318

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාරවිල සර් හර්බට් සිල්වා මාවත, අංක 466/ඒ හි පදිංචි හෙට්ටිආරච්චිගේ ටෙම්පල් ස්කොලොස්ටිකා පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජය සහ එහි ජනතාව වෙත මෙයින් දන්වා සිටින්නේ, මා විසින් මාරවිල සර් හර්බට් සිල්වා මාවත පදිංචි හෙට්ටිආරච්චිගේ ලොරේට් කැනීසියස් පෙරේරා යන අයට ලබා දී තිබූ හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් 1997 අගෝස්තු මස 23 වැනි දින ලියා සහතික කළ අංක 8473 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද බවයි.

07-332

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන වෙළඳ සමාගම් ආඥා පනතේ 9 (1) ඡේදය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

වෙළඳ සමාගමේ නම : ඩොරී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 98880
ලියාපදිංචි කාර්යාලය : අංක 12/1, ජේද්දිස් පාර, කොළඹ 03.

අධ්‍යක්ෂක.

07-333

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ඇවිනියර් අයි ටී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 91115
ලියාපදිංචි ලිපිනය : අංක 12/35, නිදහස් මාවත, ලේවැල්ල පාර, මහනුවර
ලියාපදිංචි කළ දිනය : 2013 පෙබරවාරි මස 19 වැනි දින.

07-341

---

## ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීරිගම කන්ඩලම පදිංචි හේමන්ති කනිෂ්කා වීරසිංහ වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවීර මහත්මිය විසින් 2013 මැයි මස 06 වැනි දින සකස් කරන ලද අංක 2330 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එකී කන්ඩලම මීරිගම පදිංචි ලලනි ඉෂාරා වීරසිංහ හට බලය පවරන ලද ඇටෝනි බලපත්‍රය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත් එකී ඇටෝනි බලකාරිය සිදු කරන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

හේමන්ති කනිෂ්කා වීරසිංහ.

07-375/1

### ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීරිගම කන්ඩලම පදිංචි හේමන්ති කනිෂ්කා වීරසිංහ වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවීර මහත්මිය විසින් 2013 මැයි මස 06 වැනි දින සකස් කරන ලද අංක 2331 දරන විශේෂ ඇටෝනි බලපත්‍රය මගින් එකී කන්ඩලම මීරිගම පදිංචි ලලනි ඉෂාරා වීරසිංහ හට බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත් එකී ඇටෝනි බලකාරිය සිදු කරන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

හේමන්ති කනිෂ්කා වීරසිංහ.

07-375/2

---

### ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීරිගම කන්ඩලම පදිංචි හේමන්ති කනිෂ්කා වීරසිංහ වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවීර මහත්මිය විසින් 2013 අගෝස්තු මස 19 වැනි දින සකස් කරන ලද අංක 2363 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එකී කන්ඩලම මීරිගම පදිංචි ලලනි ඉෂාරා වීරසිංහ හට බලය පවරන ලද ඇටෝනි බලපත්‍රය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත් එකී ඇටෝනි බලකාරිය සිදු කරන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

හේමන්ති කනිෂ්කා වීරසිංහ.

07-375/3

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියළුදෙනාම මෙයින් දැනගත යුතු වගනම්

මොරටුව, උයන පාර, අංක 62/6 දරන ස්ථානයෙහි පදිංචි ෂේලිෂ් අයිරින් මරියා මාර්ටින් වන මා, ප්‍රසිද්ධ නොතාරිස් කාන්ති ෆොන්සේකා විසින් වර්ෂ 2011.12.26 වැනි දින අංක 2300 දරන ඇටෝර්නි බලකරය මගින් මොරටුව, උයන පාර, අංක 62/6 දරන ස්ථානයෙහි පදිංචි ඩඩ්ලි ෂෙල්ටන් ඉග්නේෂියස් මාර්ටින් යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලකරය අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

ෂේලිෂ් අයිරින් මරියා මාර්ටින්.

07-440/1

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියළුදෙනාම මෙයින් දැනගත යුතු වගනම්

මොරටුව, උයන පාර, අංක 62/6 දරන ස්ථානයෙහි පදිංචි ජා. හැ. ප. අංක 593383156 V හිමි, මාර්ටින් ඇල්ඩන් නොයෙල් හයසින්ත් වන මා, ප්‍රසිද්ධ නොතාරිස් කාන්ති ෆොන්සේකා විසින් වර්ෂ 2011.12.26 වැනි දින අංක 2301 දරන ඇටෝර්නි බලකරය මගින් මොරටුව, උයන පාර, අංක 62/6 දරන ස්ථානයෙහි පදිංචි ඩඩ්ලි ෂෙල්ටන් ඉග්නේෂියස් මාර්ටින් යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලකරය අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

මාර්ටින් ඇල්ඩන් නොයෙල් හයසින්ත්.

07-440/2

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය අනුව දැන්වීම

සමාගමේ නම : සීමාසහිත මාස්ටර්ස් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 99116
ලියාපදිංචි කළ දිනය : 2014 ජූනි 16 වැනි දින
සමාගමේ ලිපිනය : අංක 106/5, ජාවත්ත පාර, කොළඹ 05.

07-380

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| 1. එස් ජී එෆ් කෙයා ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 99063 | 2014.06.19 | අංක 339, ගාලු පාර, කොළඹ 03 |
| 2. ඊගල් ග්‍රවුන්ඩ් ට්‍රාන්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 99242 | 2014.06.20 | අංක 209, 3 වැනි මහල, ධර්මපාල මාවත, කොළඹ 07. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-350

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා අයදුම්පත්

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම- 2015 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2015 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වන ම විසින් 2014.08.15 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත්‍ර හා නියමිත වේලාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

*(අ)* ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; සහ
*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රාතබා ලියුම් කවරයෙහි වම් කෙළවරේ මුදුනේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙහි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා'යි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම දින පස්වරු 2.30 ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම සඳහා" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙන ම පැහැදිලිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රයක්ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැලකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී ආරක්ෂක හේතු මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම 2014.10.15 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැක.

ඩී. එම්. එන්. ජී. ජී. ටී. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2014 ජුනි මස 25 වැනි දින,
මහනුවර සහ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2015 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව**

| *අනුක්‍රමික අංක කොට්ඨාසය තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 1 කොළඹ වීදිය විදේශ මත්පැන් තැබෑරුම | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මංසන්ධියෙන් කොළඹ වීදිය වඩුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ | පෙ.ව. 11.00 සිට ප.ව.2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2014.08.15 පෙ.ව. 10.30 |

*විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල* - 2015

1. අංක 1 විදේශ මත්පැන් තැබෑරුම් - රුපියල් 5,000.

07-374/2

## උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2015 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2014.08.13 වැනි දින පෙ. ව. 10.30ට ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාව සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්; හා

*(ආ)* වත්කම් සහතිකයක්
සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙලවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරය ඉදිරිපත් කර "වරප්‍රසාද මිලදී ගත් තැනැත්තායි" ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදල් වලින් හෝ බැංකුවකින් 'ගෙවීම් සඳහා' ලකුණු කර චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2014.10.13 වැනි දින පෙ. ව. 10.30ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2014 ජුනි මස 18 වැනි දින,
ගම්පොල- උඩපළාත,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2015 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අනු. අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 | 2014.08.13 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 3,000 0 |

07-200/2

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැන්ක් පීඑල්සී - ඩිවලොප්මන්ට් බැන්කිං යුනිට්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහරගම නගර සභා සීමාවන් තුළ පරණ පාර කොට්ටාව විහාර මාවත කොතලාවල දැන් වැලිවිට පිහිටි දබුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. එස්. ජී. ප්‍රනාන්දු විසින් 2004.09.10 වැනි දින සාදන ලද අංක 328 දරන පිඹුරේ නිරූපිත 2 බී දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 30.8

එල්. එස්. ජී. ප්‍රනාන්දු විසින් 1976.08.19 වැනි දින අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් 14 සහ ලොට් 15 දරන ඉඩම් උඩින් හා දිගේ මාර්ග අයිතිය ද සමග මෙම දේපළ රාජගිරිය පදිංචි හෙට්ටිආරච්චිගේ ජයතිලක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- මහරගම නගර මධ්‍යයේ සිට හයිලෙවල් මාර්ගයේ කොට්ටාව දෙසට කි. මී. 2.5ක් පමණ මහල්වරාව හන්දිය දක්වා ගමන් ගන්න. මෙහි දී වමට හැරී හරස් පාරට පිවිස මී. 50ක් පමණ ගමන් කර දකුණට හැරී පරණ කොට්ටාව පාරට පිවිස මීටර් 150ක් පමණ ගිය පසු වම් පසින් මෙත්සිරි පෙදෙස හමුවේ. මෙම පාරේ මීටර් 50ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළට ලඟාවිය හැක.

2014 ක් වූ ජූලි මස 28 වැනි දින පෙ.ව. 10.30 ට ඉහත විස්තර කර ඇති නිශ්චල දේපළ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2011.12.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2011.12.22 ඩේලිමිරර්, ලංකාදීප සහ 2012.02.16 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකාරිණී (නීති),සෙලාන් බැන්ක් පීඑල්සී සෙලාන් ටවර් ගොඩනැගිල්ල, 14 වැනි මහල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456487/011-2456477/011-2456488

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595

07-335

### හැටන් නැෂනල් බැන්ක් පී එල් සී - නගර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වත්තල ප්‍රාදේශීය සභා හැඳල උපකාර්යාල සීමාවන් තුළ හැඳල ගමේ කාසගහ පාරේ වරිපනම් අංක 26 ඒ පිහිටි තලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් සාදන ලද අංක 2601 දරන පිඹුර ප්‍රකාර ලොට් 3 දරන ඉඩම් කොටසට හා එහි තුළ පිහිටි දෙමහල් නිවස ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 15. (ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 4 දරන මාර්ග අයිතිය ද සමඟ)

මෙම දේපළ, කහදවිට ගමගේ දොන් ඇලෝයි ප්‍රියන්ත ගුණවර්ධන යන අය බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- හැඳල හන්දියේ සිට හැඳල පාරේ මරදාන පාර දක්වා ගමන් ගෙන ස්වල්ප දුරක් ඉදිරියට ගොස් නිමල මරියා මාවතට හැරෙන්න. මෙම පාරේ මීටර් 150ක් පමණ ගමන් ගත් පසු මෙම පාරේ දකුණු දෙසින් අඩි 10ක් පළල මාර්ග ප්‍රවේශයේ අදාළ දේපළ පිහිටා තිබේ. (අංක 26 ඒ දරන දේපළ)

2014 ක් වූ ජූලි මස 28 වැනි දින ප.ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.06.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.06.02 දින ද අයිලන්ඩ්, දිවයින හා 2009.06.05 වැනි දින තිනකරන් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011- 2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081- 2210595/071-4755974/071-8446374/ 077- 7761706

07-336

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 74715669
රංජිත් රත්නසිරි රාජපක්ෂ මහතාට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.06.20 දිනැති අංක 1868 දරන *ගැසට් පත්‍රයේ* හා 2014 ජුනි 06 වැනි සිකුරාදා දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.08.16 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### ඉහත සඳහන් පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, පල්ලෙපත්තුවේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නැගෙනහිර රත්මලාන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ රත්මලානේ පිහිටි "දියපොරගහඕවිට" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුලත් ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් සාදන ලද 2001 ඔක්තෝබර් මස 04 දිනැති අංක 0967 දරන පිඹුරෙහි ලොට් ඒ 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ 1 උතුරට : පී කරෝලිස් සිල්වා සහ වෙනත් අයට අයිති ඉඩම සහ ලොට් ඒ 2 ද නැගෙනහිරට : ලොට් ඒ 2 සහ ඒ 3 ද, දකුණට : ලොට් ඒ 3 සහ ලූනා ඇල ද බස්නාහිරට : ලූනා ඇල ද මායිම්ව එකී අංක 0967 දරන පිඹුරට අනුව පර්චස් 20 ක (අ. 0

රූ. 0 පර්. 20) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 42/90 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග එකී අංක 0967 දරන පිඹුරෙහි ඇති පාරවල් ද අයත් වේ.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැනක දී මැන සාදන ලද 2008 ඔක්තෝබර් මස 07 දිනැති අංක 5908 දරන පිඹුරෙහි පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී රත්මලාන පිහිටි ජයසුමනාරාම පාරේ, වරිපනම් අංක 78/18 දරන "දියපොරගහඕවිට" නැමති ඉඩමට අයත් ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත් වූ එකී අංක 5908 දරන පිඹුරෙහි ලොට් බී ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් බී උතුරට : කරෝලිස් සිල්වා හා වෙනත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : අංක 0967 දරන පිඹුරෙහි ලොට් ඒ 2 ද, දකුණට : අඩි 20 පළල පාර ද, බස්නාහිරට පාර ද මායිම්ව එකී අංක 5908 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

**දෙවන උපලේඛනය**

එකී රත්මලානෙහි පිහිටි "දියපොරගහඕවිට" නැමති ඉඩමෙහි එකී අංක 0967 දරන පිඹුරෙහි ලොට් ඒ 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ 3 උතුරට : ලොට් ඒ 1 සහ ඒ 2 ද, දකුණට : දැනට පවතින පාර සහ අංක 4406/පී දරන පිඹුරෙහි ලොට් ඒ හි කොටසක් ද, බස්නාහිරට : ලූනා ඇල ලොට් 1 ද මායිම්ව එකී අංක 0967 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඊ 41/91 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. එස්. අබේනායක මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
ගල්කිස්ස.

07-359

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ නුගේගොඩ සිය ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක පී වී 3948 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියාපදිංචි අංක එන් (පී වී එස්) 20493 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) මෙසස් ඕවින් ගැසස් ප්‍රයිවට් ලිමිටඩ් සහ නුගේගොඩ පදිංචි සුමිත් නිමලසිරි විජේසිංහ ඒකනායක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසිය .-*

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේශ්වරම් පත්තුවේ, මාදම්පේ, දෙමටපිටිය සහ කීණගස්විල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද 1959.04.27 දිනැති අංක 5533 දරන සැලැස්මේ නිරූපනය වන කීණගස්වල එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර තිහක් (අ. 30, රූ. 0 පර්. 0) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 ජූලි මස 31 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - හලාවත සිට කොළඹ පාර ඔස්සේ ගොස් 46 වන සැතපුම් කණුව දක්වා පැමිණි විට ඇති කාක්කපල්ලිය මංසන්ධියෙන් වම්පසට ඇති මැදගම පාරට හැරෙන්න. එම මාර්ගයේ ඉදිරියට ගිය විට ඇති 4 වන කි. මී. කණුව ද, පසුකර තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය .-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කෝට්ටේ නගර සභා සීමාව තුළ කලින් නුගේගොඩ දුම්රියපල පාර නමැති ස්ටැන්ලි තිලකරත්න මාවත යාව පිහිටි බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1979.09.02 දිනැති අංක 1507 දරන සැලැස්මේ නිරූපනය වන කොත්තනුවේ කුඹුර නමැති ගොඩනැගිලි, ගස්. වගා, බිම් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 4 ඒ 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 1507 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 ජූලි මස 30 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - නුගේගොඩ විදුලි සංඥා පුවරුව අසල සිට ස්ටැන්ලි තිලකරත්න මාවත ඔස්සේ මීටර් 300 ක පමණ දුරක් ගිය විට වරිපනම් අංක 221 දරන අදාල දේපළ ස්ටැන්ලි තිලකරත්න මාවතේ පාරේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2014.04.04 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2014.04.07 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.04.04 දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්, 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලනේ ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණී (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2456476, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011 - 3068185, 011- 2572940.

07-316

---

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

හෝමාගම දිසා අධිකරණයේ දී ය

උකස් ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ වන ඉල්ලීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ VII පරිච්ඡේදය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගනේගම කංකානමගේ දිස්නා ස්වර්ණසීලි
අංක 13/4, දීපංගොඩ, හෝමාගම.

නඩු අංකය : 12816/උකස්
කැස්බෑව දිසා අධිකරණයේ ඇස්කිසි අංකය : 02/2014

..................................පැමිණිලිකාරිය.

එදිරිව

හෙට්ටිආරච්චිගේ ජයන්ත සලමන්
අංක 195/135, බණ්ඩාරනායකපුර,
මත්තේගොඩ, පොල්ගස්ඕවිට.

..............................විත්තිකරු

හෝමාගම දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් නිකුත් කර ඇති නියෝගය මත ඉහත විත්තිකරු වෙතින් පැමිණිලිකාරියට අයකර ගැනීමට ඇති රුපියල් ලක්ෂ දොළහක (රු. 1,200,000) මුදලක් සහ නෛතික පොලිය ලෙස රුපියල් පන්ලක්ෂ තිස්අටදහස් හයසියයක් (රු. 5,38,600) සහ නඩු ගාස්තු ද, අයකර ගැනීම සඳහා කැස්බෑව දිසා අධිකරණයේ නියෝජ්‍ය පිස්කල් විසින් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ විස්තරවන හෝමාගම, දීපංගොඩ, හත්ලහගොඩ පිහිටි පර්චස් දාහතක් (අ. 0 රූ. 0 පර්. 17) විශාල ඉඩම, කැස්බෑව දිසා අධිකරණයේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාවට අනුව 2014 අගෝස්තු මස 05 වැනි දින පෙ. ව. 10.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.* - කොට්ටාව සිට හොරණ මහා මාර්ගයේ දිපංගොඩ හංදියේ පාලම අසලින් වමට ඇති හත්ලහගොඩ පාරේ ගොස් හත්ලහගොඩ පන්සල ඉදිරිපසින් ඇති ඉඩම්වලට යාමට ඇති පාරේ අවසානයට මෙම දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වන මා වෙත මුදලින් හෝ බැංකු අණකරයකින් පමණක් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසියේ මුළු ගැණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක්. ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත හෝමාගම දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.
02. හෝමාගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු 1%ක වෙළඳ බද්ද මුළු මුදලට,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල මුළු ගැණුම් මුදලට සියයට දෙකහමාරක් (2 1/2%),
04. වෙන්දේසිය පැවැත්වීම සඳහා වියදම් වී ඇති සියලු මුදල්,
05. විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු,
06. ලිපිකරු හා සෝෂක ගාස්තු සහ පොලිස් නිලධාරීන්ට බටා මුදල්.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාගම්මන යන ගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට වර්ෂ 2007.07.12 වැනි දින යූ. එල්. එන්. ටී. චන්දන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 3841 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ අංක 2 බී දරන කැබැල්ල වූ උතුරට : එකී පිඹුරේ 2 ඒ සහ 2 සී දරන කැබලි ද, නැගෙනහිරට : පියසේන විජේසිංහට අයිති ඉඩම ද, දකුණට : එම්. ඩී. තිලකරත්නට අයිති කුඹුර ද, බස්නාහිරට : අංක 1698 පිඹුරේ අංක 01 දරන කැබැල්ල ද, මායිම් වූ පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල බිම් ප්‍රමාණය සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියලු දේ ද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 151/45 හි ලියාපදිංචි වී ඇත.

ඉහත අංක 384 දරන පිඹුරේ අංක 2 දරන කැබැල්ල සහ වර්ෂ 1999.12.07 වැනි දින යූ. එල්. එන්. ටී. චන්දන බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1698 දරන පිඹුරේ කැබලි අංක 03 දරන කැබැල්ල ප්‍රවේශ මාර්ගය වශයෙන් භාවිතා කිරීමේ අයිතිවාසිකම ද වේ.

වැඩි විස්තර දැන ගැනීමට දිස්නා ස්වර්ණසීලී මහත්මිය, පැමිණිලිකාරිය- දුරකථන අංකය : 077 - 6771918.

එන්. ජේ. එදිරිසිංහ,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු හා
තක්සේරුකරු.

2014 ජුනි මස 26 වැනිදා,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය, නුගේගොඩ.
දුරකථන අංකය : 077- 453463.

07-339

### මහජන බැංකුව - හිඟුරක්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ සිංහලපත්තුවේ 71 එච් පන්සල්ගොඩැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පන්සල්ගොඩැල්ල නමැති ගමෙහි පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි අටයි හයක් (හෙක්. 0.286) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014.07.31 වැනි දින පෙ.ව . 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2001.07.20 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ, පුවත්පත්වල 2002.12.13 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - හිඟුරක්ගොඩ නගරයේ සිට පිංපාර හරහා පන්සල්ගොඩැල්ල මාර්ගයේ කිලෝ මීටර් 08ක් ගිය විට හමුවන උල්කටු ඇල හන්දියෙන් උල්කටු ඇල මාර්ගයේ මීටර් 250ක් ගිය පසු දකුණු පස ප්‍රස්තුත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු යः-

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1 /2%ක්,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත පොළොන්නරුව, නව නගරය, මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

දුරකථන අංක : 027-2224404, 2223900, 2225760.
ෆැක්ස් අංකය : 027 - 2223522.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

පූර්ව දැනුම් දීමකින් තොරව වෙන්දේසිය කල් තැබීමේ හෝ නැවැත්වීමේ අයිතිය බැංකුව සතු වේ.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එක රටක්, එකම වෙන්දේසිකරුවෙක්
වසර 121 කට අධික කලක හොඳ සේවා සැපයීමක්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

07-354

---

### පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ අගෝස්තු මස 01 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ පිටිගල් කෝරළේ දකුණේ යටකලන් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පහල හත්තිනිය ග්‍රාමයේ කහටගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ (බලයලත් මිනින්දෝරු එම් ජී එස් සමරතුංග විසින් මැන සාදන ලද 1984.07.11 දිනැති අංක 2022 දරන පිඹුරේ කැබලි අංක 1 හි කැබලි කැඩීමක් වූ සහ බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් මැන සාදන ලද 1986.06.11 දිනැති අංක 2022 ඒ දරන පිඹුරේ කැබලි අංක 3 හි නැවත මැනීමක් වූ) බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් මැන සාදන ලද 2010.10.06 දිනැති අංක 6533 දරන පිඹුරේ කැබලි අංක 1 දරන කැබැල්ල නමැති ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ය.

විශාලත්වය : අ. 0, රූ. 1, පර්. 8.

කුමාරගේ වත්තගේ නිවන්ත ශානක ප්‍රනාන්දු සහ වර්ණකුලසූරිය මේරි ඩොරින් ඇනෙස්ටා ප්‍රනාන්දු විසින් බන්ධනදායීන් ලෙස ද වර්ණකුලසූරිය මේරි ඩොරින් ඇනෙස්ටා ප්‍රනාන්දු උකස්කරු ලෙස කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්ලිව්. හපුහින්න විසින් සහතික කරන ලද වර්ෂ 2010 ක් වූ දෙසැම්බර් මස 21 වැනි දිනැති අංක 204 සහ හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද වර්ෂ 2011 ක්වූ දෙසැම්බර් මස 19 දිනැති අංක 841 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.06.27 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ 2013.12.20 *ගැසට් පත* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - පෑන් ඒෂියා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ සිට හලාවත පාරේ හලාවත දෙසට මාරවිල හන්දිය දක්වා ගොස් 56 කිලෝ මීටර කණුව පසුකොට තවත් මීටර් 500 පමණ ගිය විට වම් පසින් මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල් වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු යඃ-

1. ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමනාකරු - ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667218/011-2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 134,
බැද්දගාන පාර, කෝට්ටේ.

07-351

---

**හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. - අම්බලන්ගොඩ ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩේවිඩ් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2007.04.24 දිනැති සහ අංක 2888 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ගෝනපිනුවල විතානගේ හර්බට් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2014ක් වූ ජූලි මස 28 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ ගොඩගම, පැපිලියගහඋඩුමුල්ල, කොස්ගහවෙල්යාය දරන පරිශ්‍රයන් හි පිහිටි ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. පී. ඩී. යූ. කරුණාරත්න විසින් මැන සාදන ලද 2007.04.12 දිනැති අංක 400 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් "ඒ" ලෙස සළකුණු කළ ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේත්. විශාලත්වය රූඩ් දෙකයි, පර්චස් දොළහක් (අ. 0, රූ. 2, පර්. 12)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.02.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2013.02.01 වැනි දින ලක්බිම, තිනකරන් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මිටියාගොඩ කඩවිදියේ අළුත්වෙල පාරේ කි. මී. 2 1/2ක් පමණ ගිය විට හමුවන කොස්ගහවෙල හි අදාළ දේපළ පිහිටා ඇත. නැගෙනහිර මායිමෙන් ප්‍රධාන පාරට යාබදව සහ එම පාරට මුහුණලා දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0112 - 337707
0777- 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0112- 337707

07-342

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 73582945.
පන්නිපිටිය, ඇරැව්වල අංක 691/1 හි පදිංචි වැලිවත්තගේ දොන් කපිල මහතා සහ ඇල්විටිගලගේ දොන් තනූජා මහත්මිය.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.02.07 දිනැති අංක 1849 දරන *ගැසට් පත්‍රයේ* හා 2014.01.28 දිනැති "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර එකී ස්ථානයේ දීම 2014.08.09 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි, වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කැස්බෑව නගර සභා සීමාව තුළ සල්පිටි කෝරලේ, පල්ලෙපත්තුවේ, අංක 581/ඒ, දරන ඇරැව්වල උතුර ග්‍රාම නිලධාරි කොට්ටඨාසයේ, ඇරැව්වල ග්‍රාමයේ පිහිටි ප්‍රධාන පාරේ, වරිපනම් අංක 051 දරන මීගහවත්ත (කොටස) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 1991 ජුනි මස 22 දිනැති අංක 104 දරන පිඹුරෙහි ලොට් 5 ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 5 ඒ, උතුරට : ඩී. එස්. පතිරගේ සහ වෙනත් අය මෙන්ම ඩී. ජී. පෙරේරා විසින් උරුමකම් කියනු ලබන මීගහවත්ත (කොටස) ද, නැගෙනහිරට : ඇරැව්වල පාර ද, දකුණට : ලොට් 5 බී ද, බස්නාහිරට : ඩී. එස්. පතිරණ සහ වෙනත් අය විසින් උරුමකම් කියනු ලබන මීගහවත්ත (කොටස) ද, මායිම්ව එකී අංක 104 දරන පිඹුරට අනුව පර්චස් විසි හතයි දශම තුනයි හතක (අ. 0, රූ. 0, පර්. 27.37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 57/94 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එම්. ජී. ජේ. සී. සිප්කඩුව මහතා,
කළමනාකරු.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
ලංකා බැංකුව,
කොට්ටාව.

07-358

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. එම්. රුලිගු සහ ජී. ටී. එම්. එම්. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 0024 5002 2058.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013 අප්‍රේල් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් හත් ලක්ෂ විසි එක් දහස් අටසිය විසි හතරයි ශත හතලිස් දෙකක (රු. 57,21,824.42) මුදල ද, 2013 මාර්තු මස 16 වැනි දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) රුපියල් විසි පන් ලක්ෂ හැත්තෑ එක් දහස් පන්සිය අනූ හතරයි ශත දහසයක (රු. 25,71,594.16) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013 අගෝස්තු මස 30 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2013 අගෝස්තු මස 08 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2014 ජූලි 31 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### ඉහතකී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ මුන්නක්කරය (මාන්කුලිය) වෝඩ් අංක 01, පිහිටි වරිපනම් අංක 49/15 දරන "මාන්කුලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. මෙන්ඩිස් යන අය විසින් සාදන ලද 2010 දෙසැම්බර් මස 27 දාතම හා අංක 4693 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (මහ නගර සභාව) නැගෙනහිරට : ලුණු ලේවාය, දකුණට : ඒ ෂෙල්ටන් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ඇන්ටන් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හතරයි හතක් (අ. 0 රූ. 0 පර්. 12.47) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4693 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී මුන්නක්කරය (මාන්කුලිය) වෝඩ් අංක 01, පිහිටි "මාන්කුලියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. පී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1924 මැයි මස 19 දාතම හා අංක 840 පී දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණයකොට බෙදා වෙන්කොට ලොට් බී වශයෙන් ලකුණුකොට ඇති ඉඩමේ නොබෙදූ 1/2 කොටසට මායිම්, උතුරට: ආරොන් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : ලුණුපාලම, දකුණට : ලියනගේ ජුවන් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ජුවන් සිල්වා

යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් (අ. 0 රූ. 0 පර්. 22) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 840 පී දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ඒ 317/208 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-356/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඒ. ජී. එන්. ආර්. කුලරත්න.
ගිණුම් අංක : 0154 5000 1144.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 අප්‍රේල් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් හය ලක්ෂ හාර දහස් තුන්සිය පනස් නමයයි ශත පහළවක (රු. 56,04,359.15) මුදල ද, 2014 මාර්තු මස 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් නම ලකෂ හැත්තෑ දෙදහස් පන්සියයක (රු. 49,72,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.05.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2014.05.12 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ " අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2014 ජූලි 30 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ තමන්කඩුව කෝරළේ තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උඩවෙලගම 124 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩවෙලගම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් මස 24 දාතම හා අංක 1466 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 90/03 දරන පිඹුරේ ලොට් 02 නැගෙනහිරට : පාර සඳහා වෙන් කිරීම, දකුණට : අංක 90/03 දරන පිඹුරේ ලොට් 04 සහ බස්නාහිරට : ලොට් FCP 115 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0 රූ. 2 පර්. 0) හෝ හෙක්ටයාර් 0.2024ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1466 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව LDO බී/5/92 යටතේ පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

07-356/2

---

**ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්**

මීගමුව දිසා අධිකරණයේ දී ය

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්
වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

..............................පෙත්සම්කරු

නඩු අංකය :
3136/විශේෂ

එදිරිව

01. මැරුක්කු කංකානමලාගේ ලලිතා චන්ද්‍රානි
අංක 168 බී, කෝවින්න, ආඩිඅම්බලම

02. මාරුක්කු කංකානමලාගේ කැළුම් දිනේෂ් සංජීව
අංක 168 බී, කෝවින්න, ආඩිඅම්බලම

03. සිංහල මහමුදලිගේ මිල්රෝයි,
කෝවින්න, ආඩිඅම්බලම.

....................................වගඋත්තරකරුවෝ

මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාවට අනුව ඉහත වගඋත්තරකරුවන්ගෙන් පෙත්සම්කරුහට අයවිය යුතු රුපියල් නවලක්ෂ අනූඑක්දහස් අටසිය අසූවක (රු. 991,880) මුදලක් ද, නඩු ගාස්තු අයකර ගැනීම සඳහා ද, එම මුදල මත නඩුවේ දින දක්වා කාලයට ඊට අදාල නෛතික පොලිය අයකර ගැනීම සඳහා ද, පහත උපලේඛනයේ වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම මුදල් අයකර ගැනීම සඳහා කෝවින්නේ දයාසේන මාවතේ පිහිටි පහත උපලේඛනයේ වඩාත් විස්තර වන ප්‍රමාණයෙන් පර්චස් එකොළහක් (අ. 0 රූ. 0 පර්. 11) වන ඉඩම 2014 අගෝස්තු මස 07 වැනි දින පෙ. ව.

11.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-* මීගමුව කිඹුලාපිටිය හංදියේ සිට ආඩිඅම්බලම දක්වා පැමිණ එතැනින් කෝවින්න පාරේ ගොස් මුස්ලිම් පල්ලිය අසලින් ඇති දයාසේන මාවතේ පැමිණි විට මෙම දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.* - දේපළ වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් වෙන්දේසිකරු වන මා වෙත මුදලින් හෝ බැංකු අණකරයින් පමණක් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. මුළු ගැණුම් මුදලෙන් සියයට විසිපහක (25%) මුදලක් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට මීගමුව දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
02. අදාළ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු 1% ක වෙළඳ බද්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාර (2 1/2%) බැගින් මුළු ගැණුම් මුදලට,
04. වෙන්දේසිය සඳහා වියදම් කර ඇති සම්පූර්ණ මුදල,
05. විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අළුත්කුරු කෝරළයේ දාසිය පත්තුවේ කෝවින්නේ පිහිටි බුළුගහවත්ත සහ මිල්ලගහවත්ත නැමති ඉඩමට ඩබ්ලිව්. ඩී. නන්දන සෙනෙවිරත්න බලයලත් මිනින්දෝරු තැන විසින් 1996.10.31 වැනි දින මැන සැදූ අංක 3240 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ අංක 01 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : ඊ. ඩී. කුසුමා නන්දනීට සහ තව අයටත් අයිති ඉඩම ද, දකුණට : අංක 02 දරන පාර (මීටර් 3.05ක් පලළ පාර) ද, නැගෙනහිරට පාර ද, බස්නාහිරට ඩබ්ලිව්. කේ. එඩ්වින් අප්පුහාමිට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් එකොළහක් (අ. 0 රූ. 0 පර්. 11) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් සමග වේ.

තවද, එකී අංක 3240 දරන පිඹුරේ සඳහන් අංක 02 සහ අංක 658 දරන පිඹුරේ අංක 01 බී දරන බිම් තීරයන්හි සම්පූර්ණ මාර්ග පරවශතා අයිතීන් සමග වේ. පෙර ලියාපදිංචිය සී. 943/81

*වැඩි විස්තර විමසීමට .-* බැංකු කළමනාකාරිණිය, කටාන විවිධ සේවා සමුපකාර සමිතිය, දෙමන්හංදිය.
දුරකථන අංකය : 077- 4656121

එන්. ජේ. එදිරිසිංහ,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු හා තක්සේරුකරු.

2014 ජුනි මස 26 වැනිදා,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය, නුගේගොඩ.
දුරකථන අංකය : 0777 - 453463.

07-340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.